www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආන්ඩුව කම්කරුවන්ගේ අරගල මැඩීමට සැරසෙයි

## Sri Lankan government prepares to suppress the struggles of workers

ඩබ්ලිව්. ඒ. සුනිල් විසිනි
2006 අගෝස්තු 22

ශ්‍රී ලංකාව තුල සිවිල් යුද්ධය පැතිරෙද්දී, ජීවන තත්වයන් හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කර ගැනීමට කම්කරුවන් විසින් කරනු ලබන කවර හෝ ක්‍රියාවක් වලක්වා ලීමේ ඔහුගේ උත්සාහය ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් තීව්‍ර කර ඇත.

ජුලි 27 කන්දේගම දී ප්‍රසිද්ධ රැස්වීමක් අමතමින් ජනාධිපති මෙසේ පැවසී යː "රට ආරක්ෂා කිරීම සෑම කෙනෙකුගේ ම වගකීමකි. රටේ ආරක්ෂාව පාවාදීමට කිසිවෙකුටත් අයිතියක් නැත. ගැටලුවලට සාකච්ඡා මගින් විසඳුම් සොයා ගැනීමට සෑම වෘත්තීය සමිති නායකයෙකු ම සූදානම් විය යුතු යි" අගෝස්තු 1 කොලඹ දී රැස්වීමක් අමතමින් ඔහු නැවතත් අනතුරු ඇඟවී යː "මහජනතාව තමන්ගේ අයිතීන් ආරක්ෂා කර ගැනීමට කවර හෝ පියවරක් ගැනීමට පෙරාතුව ඔවුන්ගේ වගකීම් සහ මව්බිම ගැන දැනුවත් විය යුතු යි."

"වගකීම", "ජාතික ආරක්ෂාව" සහ "මව් බිම ආරක්ෂා කිරීමේ" මෙම ආයාචනයන්ට නිශ්චිත දේශපාලන අර්ථයක් සහ ශ්‍රී ලංකාව තුල එයට දිගු ඉතිහාසයක් ඇත. ගැටුම තුල සිදු වූ මිනිස් සංහාරය සහ පිරිහෙන ජීවන තත්වයන් පිලිගනිමින් වැඩ කරන ජනයා යුද්ධයට වන්දි ගෙවිය යුතු යයි රටේ දිග්ගැසුනු සටන පුරාම කොලඹ පාලක ප්‍රභූව යලි යලිත් අවධාරනය කර තිබේ.

සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුනේ සහ (ජවිපෙ) එහි වෘත්තීය ජාතික සමිති මධ්‍යස්ථානයේ සහයෝගය ලබා ගැනීම සඳහා අගෝස්තු 13 ජනාධිපති රාජපක්ෂ ඔවුන් සමග සාකච්ඡාවක් පැවැත්විය. ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රීන් සහ වෘත්තීය සමිති නායකයන් ද වන කේ.ඩී. ලාල්කාන්ත, පියසිරි විජේනායක සහ වසන්ත සමරසිංහ ඔහුගේ නිල නිවසට රැස්වූහ.

"රටේ තත්වය සැලකිල්ලට ගෙන" කාර්මික ක්‍රියාවන් මගින් නොව සාකච්ඡා මගින් කාර්මික ආරාවුල් විසඳා ගැනීමට පියවර ගන්නා ලෙස ජනාධිපති වෘත්තීය සමිතිවලින් ඉල්ලා සිටියේ ය. ජවිපෙ සියලුම වෘත්තීය සමිති නායකයෝ වහාම එකඟ වූහ. 2002 සටන් විරාම ගිවිසුම අවසන් කිරීම විවෘතව ඉල්ලා සිටින මෙම පක්ෂය, "සියල්ලම මව්බිම වෙනුවෙන් කැප කරනු" තේමාව යටතේ රට පුරාම උද්ඝෝෂනයක නිරතව සිටී.

ජනතා විමුක්ති පෙරමුනේ සහයෝගය ඇතිව ඔහු ගිය නොවැම්බරයේ පැවති ජනාධිපතිවරනය යන්තම් ජය ගැනීමට රාජපක්ෂට හැකි විය. "පොදු ජනතාවගේ මිනිහා" ලෙස තමන්ව හුවාදක්වා ගත් ඔහු සැලකිය යුතු වැටුප් වැඩිවීමක් සහ දුප්පතුන්ට සහන සැලසීම ඇතුලු පොරොන්දු මාලාවක් නිකුත් කලේ ය. බලයට පත් වූ විගසම ඔහු පොරොන්දු කැඩුවේ ය. පුද්ගලීකරනය ආර්ථික ප්‍රතිව්‍යුහකරන පියවරයන් සහ අයවැය කප්පාදු හරහා රාජපක්ෂ ආන්ඩුව ජීවන තත්වයන්ට අඛන්ඩ ප්‍රහාරයක් එල්ල කර තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස අත්‍යවශ්‍ය භාන්ඩ සහ සේවාවන්ගේ මිල අහස උසට නැගීමට එරෙහිව සමාජ නොසන්සුන්තාවය වර්ධනය වෙමින් ඇත. ජුලි මාසය දක්වා වූ මාස හත ඇතුලත ජීවන් වියදම් දර්ශකය 4,304 සිට 4,672 දක්වා ඒකක 368 න් ඉහල ගොස් තිබේ. වැඩ කරන ජනතාවගේ පලල් ස්තරයන් තුල වැඩෙන අසංතෘප්තිය පෙන්නුම් කරමින් මාර්තු මාසයේ දී දහස් ගනනක් රාජ්‍ය අංශයේ සේවකයෝ විරෝධතා ව්‍යාපාරයක් දියත් කලහ.

ජුලි මාසයේ දී, කොලඹ වරාය සේවකයන් වැටුප් ඉල්ලීම් මත අරගලයකට එලඹි අතර ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ සේවකයෝ පුද්ගලීකරන සැලසුම්වලට එරෙහි අරගලයකට සූදානම් වූහ. ව්‍යාපාරික කවයන්ගේ උත්සුකතාවන්ට ප්‍රතිචාර දක්වමින් උසාවි වාරන නියෝග ලබා ගැනීම මගින් ආන්ඩුව උද්ඝෝෂන තහනම් කලේ ය. කවර හෝ අරගලයක් කිරීම තහනම් කරමින් වරාය සේවකයන්ට විරුද්ධව නිකුත් කල උසාවි වාරන නියෝගය නොවැම්බර් 27 දක්වා දීර්ඝ කර තිබේ.

කම්කරු පන්තියට මොනම සහනයක් වත් දීමේ හැකියාවක් රාජපක්ෂට නැත. වෙලඳපොල ප්‍රතිසංස්කරන තීව්‍ර කිරීමට පීඩනය යෙදීමක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව සියලු නය දීම් නතර කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස එදිනෙදා

වියදම්වලට ජාත්‍යන්තර මුදල් වෙළඳපොලෙන් නය ගැනීමට ආන්ඩුවට බලකෙරී තිබේ.

"මහා පරිමාන ආර්ථික පිලිවෙත සම්බන්ධ එහි රටාව මූල්‍ය කලමනාකරනය සහ ආර්ථික ප්‍රතිසංස්කරන සම්බන්ධයෙන් දුර්වල නිසා, 2005 සිට ලෝක බැංකුව වැනි බහුපාර්ශ්වීය නය දෙන්නාගෙන් අඩු පොලී නය ක්‍රම යටතේ නය ලබා ගැනීමට ශ්‍රී ලංකාවට දුෂ්කර වී තිබේ. මේ නිසා එයට වඩවඩාත් වානිජ ඩොලර් මත යැපීමට සිදුව ඇත." ලංකා බිස්නස් ඔන්ලයින් ඊයේ සඳහන් කලේ ය.

රට යලි යුද්ධයට ඇද දැමීමේ රාජපක්ෂගේ තීන්දුව තුඩු දෙනු ඇත්තේ ආර්ථික අර්බුදය ගැඹුරු කිරීමට පමනි. අනිවාර්යයෙන් ම මිලිටරි වියදම් ඉහල නැගීම පමනක් නොව, අත්‍යවශ්‍යව ඇති විදේශ ආයෝජන පහත වැටීමකට ද ගැටුම හේතුකාරක වනු ඇත. සටන දිග් ගැස්සෙන විට ව්‍යාපාර සහ යටිතල පහසුකම්වලට සිදු වන විනාශය ඉහල නගිනු ඇත.

වරාය සහ ලංකා ඛනිජ තෙල් සංස්ථාව පාලනය සම්බන්ධව දැනට මත් විවේචනශීලි වන මහ ව්‍යාපාරිකයෝ "කාර්මික සාමය" පවත්වා ගෙන යාමට පියවර ගන්නා ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටිති. " වගකීම් විරහිත සහ ආත්මාර්ථකාමී වෘත්තීය සමිති ක්‍රියාවන්ට එරෙහිව දැඩි ක්‍රියා මාර්ගයන් ගන්නා ලෙස ඉල්ලමින්" ලංකා ජාතික කර්මාන්තකරුවන්ගේ මන්ඩලය ජුලි 25 රාජපක්ෂට ලිවී ය.

කාර්මික උද්ඝෝෂන ක්ෂනිකව ම මැඩ පැවැත්වීමට අසමත් වීම ගැන ජුලි 30 ද සන්ඩේ අයිලන්ඩ් පත්‍රයේ කතුවැකිය ආන්ඩුවට චෝදනා කලේ ය. "වර්ජන ආයුධය යොදා ගෙන අවම වසයෙන් තමන්ට උවමනා දෙයින් කොටසක් ලබා ගෙන වෘත්තීය සමිති දැනට මත් ආරම්භයක් ගෙන තිබේ. සෙසු වෘත්තීය සමිති ඛනිජ තෙල් සංස්ථාවේ සහ වරායේ ආදර්ශය අනුගමනය කිරීම කාලය පිලිබඳ ප්‍රශ්නයක් පමනි" එය අනතුරු ඇඟවී ය.

කම්කරුවන්ගේ අරගල යටපත් කිරීමට සහ දුර්වල කිරීමට දැනුවත්ව වැඩ කර ඇති වෘත්තීය සමිති නායකයන් තමන්ට මෙල්ල කර ගත හැකි බව සංගත ප්‍රභූහු හොඳින්ම දනිති. කෙසේ නමුත් සැබෑ නීතිය, මහජන කෝපය සහ නොරිස්සීම පාලනය කර ගැනීමට වෘත්තීය සමිති අසමත් වීමට ඉඩ තිබීම කෙරෙහි ය. ලංකා පොදු සේවක සංගමයේ නායක ජයරත්න මලියගොඩ අගෝස්තු 6 රාවයට අදහස් දක්වමින් මෙසේ අනතුරු ඇඟවී ය. "වර්ජන මේ ආකාරයට මර්දනය කලොත් ඒවා වඩාත් තියුනුව පුපුරා යනු ඇත. ආන්ඩුව මේ කාරනය තේරුම් ගත යුතුයි."

යුද්ධය කරා යලි හැරීමේ අභිප්‍රායන් මලියගොඩගේ සඳහන් කිරීම්වලින් ඉස්මතු කෙරෙයි. වැඩ කරන ජනයාගේ මූලික සමාජ අවශ්‍යතාවන් සහ අභිලාෂයන් සම්පූර්න කිරීමට නොහැකි වීම නිසා සෑම අර්බුදයකදී ම පාලක පන්තිය යොදා ගත් ප්‍රතිගාමී මූලෝපායම ක්‍රියාවට දැමීමට රාජපක්ෂ යොමුවෙමින් සිටී: එනම් කම්කරු පන්තිය බෙදීම සඳහා වාර්ගික සැකය සහ වෛරය ඇවිලවීම ය. සිංහල බෞද්ධ රාජ්‍යය රැකීමට යුද්ධය යොදා ගැනීමේ දී ආන්ඩුව වැඩ කරන ජනයාට විරුද්ධව පන්ති යුද්ධය සූදානම් කරමින් සිටී.

© www.wsws.org